(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(13).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මැයි 12 සිකුරාදා**

---

**2023 මැයි 23 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 7 වගන්තිය යටතේ එකී කොමිෂන් සභාවේ තත්කාලීන සභාපති ධුරය හා සාමාජිකත්වය දරන ජේ.ඩබ්ලිව්.එම්.ජේ.පී.කේ. රත්නායක මහතා එම සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සඳහා යෝජනාව,— 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 7 වගන්තිය ප්‍රකාරව එහි තත්කාලීන සභාපතිවරයා සහ සමාජිකයකු වන ජේ.ඩබ්ලිව්.එම්.ජේ.පී.කේ. රත්නායක මහතා එහි සභාපති ධුරයේ සහ සාමාජිකත්වයේ තවදුරටත් කටයුතු කරගෙන යාමට උක්ත පනතේ 7(අ)(iii) සහ 7(අ)(v) වගන්ති යටතේ නුසුදුස්සකු වන බව 2023 මැයි 09 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇති මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2023 අප්‍රේල් 18 දිනැති වාර්තාව අනුව වාර්තා කොට ඇති බැවින්, ජේ.ඩබ්ලිව්.එම්.ජේ.පී.කේ. රත්නායක මහතා එහි සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට උක්ත පනතේ 7(ඇ) වගන්තිය ප්‍රකාරව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 07/2022 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— දුම්කොළ බදු (සංශෝධන) පනත යටතේ නියෝග,— 2004 අංක 9 දරන දුම්කොළ බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු 21 වගන්තිය යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/71 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය යටතේ මුද්දර ගාස්තු බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/73 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නියමය,— 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 155(1) වගන්තිය යටතේ කොළඹ කොටස් වෙළඳපොළෙහි “Over the Counter Platform” හි සිදු කරනු ලබන ආයතනික ණය සුරැකුම්පත්වල සෑම ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනුවක් සඳහාම අය කළ යුතු සෙස් බදු අනුපාතය සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 26 දිනැති අංක 2316/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ අපගමන බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 09 දිනැති අංක 2309/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියමය,— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ අපගමන බද්දක් පැනවීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/80 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 පෙබරවාරි 10 දිනැති අංක 2318/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2023.05.11 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මගහැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ චෙක් ජනරජ ආණ්ඩුව අතර, 2023 පෙබරවාරි 03 දින ඇතිකර ගත් ගිවිසුම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මහජන ආරක්ෂක අමාත්‍යතුමා,— ආගාමික හා විගාමික පනත යටතේ නියෝග,— (351 අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පී.එල්.සී. ආයතනයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14 වගන්තිය යටතේ 2023.01.05 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පී.එල්.සී. ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පී.එල්.සී. ආයතනයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14 වගන්තිය යටතේ 2023.01.05 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පී.එල්.සී. ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2023 මැයි 25 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 මැයි 25 බ්‍රහස්පතින්දා)**

3266/2023

ගරු එම්. එස්. තවුෆික් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාසික සභා රැස්වීම් පවත්වනු ලබන ශාලාවන්හි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා සඳහා සමාන්තර භාෂා පරිවර්තන පහසුකම් නොමැති දකුණු පළාතේ පළාත් පාලන ආයතන කවරේද;

(ii) දෙමළ භාෂාව භාවිතා කරනු ලබන ජනතාව සැළකිය යුතු ප්‍රමාණයක් ජීවත් වන දකුණු පළාතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශ හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශ කවරේද;

(iv) පරිපාලන භාෂා ලෙස සිංහල සහ දෙමළ යන භාෂා දෙකම භාවිතා කළ යුතු බවට ප්‍රකාශයට පත් කර ඇති බලප්‍රදේශ අයත්වන දකුණු පළාතේ පළාත් පාලන ආයතනවල මාසික සභා රැස්වීම් පවත්වනු ලබන ශාලා සඳහා සමාන්තර භාෂා පරිවර්තන පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3267/2023

ගරු එම්. එස්. තවුෆික් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සහ 1975 අංක 4 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත යන පනත්වල විධිවිධාන උල්ලංඝනය කරමින් දික්වැල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටා ඇති “අසාද්පුර” ගම්මානයේ නම සහ දික්වැල්ල - බෙලිඅත්ත ප්‍රධාන මාර්ගය දෙපස “යෝනකපුර” ලෙස සඳහන් කර තිබූ නාම පුවරු ඉවත් කර වෙනත් නම් යොදා පුවරු සවි කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති සහ සභා ලේකම්වරයාට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් දකුණු පළාතේ, පළාත් පාලන කොමසාරිස් විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති සහ ලේකම් අමතන ලද අංක 4/2/4 හා 2022.02.08 දිනැති ලිපිය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම පිළිබඳව ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/2023

ගරු එම්. එස්. තවුෆික් මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, වක්ෆ් අංශය විසින් මුස්ලිම් පල්ලි, තක්කියා, සාවියා සහ දර්ගා ඇතුළු පුණ්‍යායතනවලට අයත් නිශ්චල හා චංචල දේපල සම්බන්ධයෙන් දත්ත සමුදායක් පවත්වා නොගැනීමට හේතු කවරේද;

(ii) එසේ දත්ත සමුදායක් පවත්වා නොගැනීම හේතුවෙන් ඉහත සඳහන් ආයතනවලට අයත් දේපල, පුද්ගලික දේපල ලෙස පරිහරණය කිරීම සහ වක්ෆ් මණ්ඩලයේ අනුදැනුමකින් තොරව එම දේපල අධික මිල ගණන්වලට අලෙවි කිරීම වැනි දූෂණ හා අක්‍රමිකතා සිදු වන බව දන්නේද;

(iii) එම දූෂණ හා අක්‍රමිකතා වැළැක්වීමේ මූලික පියවර ලෙස ඉහත දේපල සම්බන්ධයෙන් විධිමත් දත්ත සමුදායක් ගොඩනැගීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 06 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1459/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ —

(i) කජු වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) වාර්ෂික කජු නිෂ්පාදනය කොපමණද;

(iii) කජු වගා කරනු ලබන ගොවීන් දිරිමත් කිරීම සඳහා කජු පැල සහ සහනාධාර ලබා දෙන්නේද;

(iv) කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1503/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු මේ වනවිට සිදු කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(iii) දේශීය හා විදේශීය සංචාරකයන්ට එම සත්වෝද්‍යානය නැරඹීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සකස් කර තිබේද;

(iv) එම සත්වෝද්‍යානයට ඉදිරියේදී සංචාරක ආකර්ෂණය වැඩිකර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා තරුණ වරදකරුවන්ගේ විශෝධන පුහුණු පාසලේ පුහුණුව ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) පුහුණුව අවසන් කිරීමෙන් පසු එම පුහුණුවට අදාළ වෘත්තීන්වල නිරතවන සංඛ්‍යාව කොපමණද;

(iii) පුහුණුව අවසන් කරන ලද තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරන්නේද;

(iv) ඔවුන් දේශීය හා විදේශීය රැකියා සඳහා යොමු කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1578/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මේ වනවිට මිනීමැරුම් ඇතුළු බරපතල ගණයේ අපරාධ සිදු කරනු ලබන බව පිළිගන්නේද;

(ii) ඒවා මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සතුව විධිමත් වැඩපිළිවෙළක් තිබේද;

(iii) ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් සිදු කරනු ලබන නිවාස මංකොල්ලකෑම්වලට අදාළ විමර්ශන කඩිනමින් සිදු නොකරන බව දන්නේද;

(iv) පෙර පැවති ආරක්ෂක කමිටු සක්‍රියව පවත්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන පාතාල කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සහ ඒ ආශ්‍රිත මිනිස් ඝාතන වැළැක්වීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1616/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1996 දී අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කළ මුතුරාජවෙල අභයභූමියේ මායිම් මේ දක්වා සලකුණු කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(ii) ඉහත අභයභූමිය තුළ පවතින රජයේ හා පුද්ගලික ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට මේ දක්වා ක්‍රියා කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉහත අභයභූමියට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අතර පරස්පරතාවයක් ඇති වීමට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1637/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලයේ ගොවීන් විසින් බහුල වශයෙන් කහ වගා කරන ලද බවත්;

(ii) එම කහ අස්වැන්න කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් බවත්;

(iii) මේ වන විට කහ මිල පහළ ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉන්දියාවෙන් කහ ආනයනය කිරීමට පියවර ගෙන තිබේද;

(ii) කහ වගා කරනු ලබන ගොවීන් ධෛර්යමත් කිරීම සඳහා ඔවුන්ගේ කහ අස්වැන්න සාධාරණ මිලකට මිලදී ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1676/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොක්කුත්තොඩුවායි සිට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තෙන්නෙයි මරවාඩි දක්වා දිවෙන කිලෝ මීටර් 15ක පමණ දුරකින් යුතු කෘෂිකාර්මික මාර්ගයක් පවතින බවත්;

(ii) එම මාර්ගය මේ වනවිට ගොවීන්ට භාවිතා කිරීමට නොහැකි පරිදි අබලන් තත්ත්වයක පවතින බවත්;

(iii) ඉහත මාර්ගයේ දෙපස ඇති කුඹුරුවල වී අස්වැන්න අලෙවි කිරීමේ කටයුතුවලදී ගොවීන් භාවිතා කරනු ලබන එකම ප්‍රවාහන මාර්ගය ඉහත මාර්ගය බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම මාර්ගය ගොවීන්ට භාවිතා කළ හැකි වන පරිදි අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1757/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මන්දපෝෂණය පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1799/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ බහුල වශයෙන් කිරිගව පාලනය සිදු කරනු ලබන බවත්;

(ii) කිරිගවයින් සඳහා ආහාර සපයා ගැනීමේදී කිරිගොවීන් දැඩි දුෂ්කරතාවයන්ට පත් වන අතර වන සංරක්ෂණ නිලධාරින් සහ වනජීවී නිලධාරින් සමඟ නිරන්තරයෙන් ගැටුම් ඇති කර ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, කිරිගවයන්ගේ ආහාර සඳහා සුදුසු තණබිම් හඳුන්වා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1808/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, කොටදෙණියාව ගම කේන්ද්‍ර කර ගනිමින් පසුගිය වර්ෂ කිහිපයක සිට විවිධ අපරාධ ක්‍රියා සිදුවන බවත්;

(ii) මේ වනවිට එම ගම්මානයේ විවිධ අපරාධ ක්‍රියා සිදුවීම හේතුවෙන් එහි වෙසෙන ජනතාව බියට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 07 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2531/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලි වැට ඉදිකර තිබෙන ප්‍රදේශ කවරේද;

(iv) එම අලි වැටවල මුළු දිග කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලි වැට ඉදිකර නොමැති ප්‍රදේශ;

(ii) එම ප්‍රදේශවල අලිවැට ඉදිකිරීම සඳහා ගනු ලබන පියවර;

(iii) මේ වනවිට ඉදිකර ඇති අලි වැට තවදුරටත් දීර්ඝ කිරීමට ගෙන ඇති පියවර;

කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2574/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික දියර කිරි අවශ්‍යතාවය කොපමණද;

(iii) කිරි ගවයන් සඳහා වෙන් කර ඇති තණබිම් ප්‍රමාණය කොපමණද;

(iv) එම තණබිම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(v) ශ්‍රී ලංකාවේ දියර කිරි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා කිරි ගවයන් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2621/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණු හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපොළවල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිවයුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2690/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රමිතියෙන් උසස් බීජ සපයා ගැනීම, කෘෂිකර්මාන්තයේ නිරත වී සිටින ගොවීන්ට ඇති ප්‍රධාන ගැටලුවක් බවත්;

(ii) වෙළඳපොළ තුළ අධික මිල ගණන්වලට බීජ අලෙවි කරනු ලබන බවත්;

(iii) එම බීජ ප්‍රමිතියෙන් තොර බවත්;

(iv) ඒ හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවයන්ට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගොවීන්ට ප්‍රමිතියෙන් උසස් බීජ ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ගොවීන්ට අවශ්‍ය බීජ රජයේ අනුග්‍රහය යටතේ ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) බීජ සඳහා පාලන මිලක් නියම කිරීමට පියවර ගන්නේද;

(iv) ශ්‍රී ලංකාවට අවශ්‍ය බීජ ප්‍රමාණය මෙරට තුළම නිෂ්පාදනය කර අඩු මිලට ගොවීන්ට ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) ගොවිජන සේවා මධ්‍යස්ථාන, ප්‍රාදේශීය බීජ ගබඩා මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2842/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කම්මල්කාර වෘත්තියේ යෙදී සිටින පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඔවුන් විසින් දැඩි දුෂ්කරතා මධ්‍යයේ කර්මාන්තය පවත්වාගෙන යමින් විවිධ වූ නිෂ්පාදන සිදු කරනු ලබන බව දන්නේද;

(iii) කම්මල්කරුවන්ගේ නිෂ්පාදන දේශීය වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ආනයනික කෘෂි මෙවලම් අධෛර්යමත් කිරීමෙන් කම්මල් කර්මාන්තය ආරක්ෂා කරගත හැකි බව දන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2932/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකය ස්ථාපනය කරන ලද දිනය හා ඉවත් කරන ලද දිනය කවරේද;

(ii) එම ඒකකය ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(iii) විදේශ රැකියා ක්ෂේත්‍රයේ අල්ලස, වංචාව හා දූෂණය ඉහළ ගොස් ඇති පසුබිමක ඉහත සඳහන් පොලිස් ඒකකය ඉවත් කිරීම, නීත්‍යානුකූල හා තාර්කික පදනමකින් තොරව ගනු ලැබූ තීරණයක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම පොලිස් ඒකකය නැවත ස්ථාපිත කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2969/2023

ගරු හේෂා විතානගේ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ප්ලාස්ටික් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට ප්ලාස්ටික් ආනයනය කිරීම සීමා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3074/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ —

(i) සේවය කරනු ලබන මුළු සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්ථිර සහ කොන්ත්‍රාත්/අනියම් පදනම මත සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොන්ත්‍රාත්/අනියම් පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2023

ගරු වමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ලෙස කටයුතු කරන ලද කාල සීමාව කවරේද;

(ii) එකී කාල සීමාව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවක් සිදු වූ බව පිළිගන්නේද;

(iii) එම බැඳුම්කර වංචාවට අර්ජුන් මහේන්ද්‍රන් මහතා සෘජුවම සම්බන්ධ බවට ඒ සම්බන්ධයෙන් පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් චෝදනා කරන ලද බව දන්නේද;

(iv) අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තනතුරට පත්කිරීම සඳහා නිර්දේශ කරන ලද හා එම පත්කිරීම අනුමත කරන ලද දේශපාලන අධිකාරියේ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

383/2023

ගරු නිතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විවිධ දුරකථන සමාගම්වලට අයත් සිම්කාඩ්පත් රජයේ නිසි නියාමනයකින් තොරව ප්‍රධාන නගරවල පදික වේදිකාවේ අලෙවි කරනු ලබන බවත්;

(ii) එම සිම්කාඩ්පත් වංචනික ලෙස විශාල වශයෙන් මිලට ගනු ලබන පුද්ගලයන් විසින් ඒවා අවභාවිතා කර විවිධ අක්‍රමිකතා සිදු කරනු ලබන බවත්;

(iii) අන්තර්ජාලය හරහා භාණ්ඩ ලබා දෙන බවට පොරොන්දු වී වංචනික ආකාරයෙන් බැංකු ගිණුම්වලට මුදල් බැර කර ගැනීමේ ජාවාරමක් සිදු කරනු ලබන බවත්;

(iv) මහනුවර, රත්නපුර, පිළියන්දල, බදුල්ල සහ කොළඹ ඇතුළු බොහෝ ප්‍රදේශවල තරුණයන් මේ වනවිට එම ජාවාරමෙහි ගොදුරක් බවට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත වංචා වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3090/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ ආධාර මත මහනුවර, ගාල්ල හා යාපනය යන නගර සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද දින;

(ii) එම එක් එක් නගරය සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබා දීමට එකඟතාවය පල කර සිටි ජාත්‍යන්තර සංවිධාන;

(iii) ඉහත සඳහන් එක් එක් නගරය සංවර්ධනය කිරීම සඳහා ලබා දී තිබූ මුදල;

(iv) ඉහත එක් එක් නගරයේ සංවර්ධන කටයුතු අවසන් කිරීමට නියමිතව තිබූ දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නගර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බලපාන ලද හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අහිමි වූ ආධාර මුදල කොපමණද;

(iii) ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3100/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ උසස්වීම් ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උසස්වීම් ලබා දීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) උසස්වීම් ලබා දීමේදී, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූලස්ථාන ශාඛාවේ සේවය කරන ලද සේවකයන්ට විශේෂත්වයක් දක්වා තිබේද;

(iv) කළමනාකරුවන් සඳහා උසස්වීම් ලබා දීමේදී, ඔවුන් පූර්වයෙන් සේවය කරන ලද ශාඛාවල ඉහළ ප්‍රගතියක් පෙන්වා තිබීම සැලකිල්ලට ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3103/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි පාසල්වල වැඩ බැලීමේ පදනම මත සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩ බැලීමේ පදනම මත පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(ii) එම විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ වැඩ බැලීමේ පදනමින් සේවය කරනු ලබන විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුව ද, වර්තමානයේදී ඔවුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(iv) එම විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3154/2023

ගරු තවරාජා කලෛයි අරසන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ගැටුම් පැවති සමයේදී දැඩි ලෙස හානියට පත්වූ අම්පාර දිස්ත්‍රික්කයේ, තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්චිකුඩියාරු, තංගවේලායුදපුරම්, සාගාමම් සහ කාන්චිරන්කුඩා යන ගම්මානවල නැවත පදිංචි කිරීමේ කටයුතු මේ වනතෙක් අවසන් කර නොමැති බව දන්නේද;

(ii) ගැටුම්කාරී වාතාවරණය අවසන්වීමෙන් පසු ඉහත ගම්මානවල ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ගනු ලැබූ මූලික පියවර කවරේද;

(iii) එම ගම්මානවල මේ වනවිට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකිරීමට නියමිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) 2023 වර්ෂය අවසන්වීමට පෙර ඉහත ගම්මානවල ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3170/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් වාර විභාග ප්‍රශ්න පත්‍ර සහ පැවරුම් ආදිය මුද්‍රණය කිරීම සඳහා වන වියදම් මේ වනවිට දෙමාපියන්ගෙන් අය කරනු ලබන බවත්;

(ii) පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම වියදම් දැරීම දෙමාපියන්ට දුෂ්කර වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද;

(ආ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමේ අයිතිය ඉහත සඳහන් අය කිරීම් හේතුවෙන් උල්ලංඝනය වන්නේද;

(ii) මුද්‍රණ කටයුතු සඳහා වන වියදම දෙමව්පියන්ගෙන් අයකර ගැනීම හැර වෙනත් විසඳුමක් විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන නිලධාරින්ට නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මෙම අයකිරීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

(iv) මෙම තත්ත්වය හේතුවෙන් පාසල් පෙළපොත් ලබා දීම සීමා කිරීමට හෝ නවතා දැමීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3228/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ, කොස්වත්ත පොලිස් ස්ථානයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට විරුද්ධව මහජන පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, විරුද්ධව පැමිණිලි ලැබී ඇති එක් එක් පොලිස් නිලධාරියාගේ නම සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර තිබේද;

(iv) එම පැමිණිලි සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3265/2023

ගරු එම්. එස්. තවුෆික් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර මාලිම්බඩ පොලිස් බලප්‍රදේශයේ, තෙලිජ්ජවිල, සොරගොඩ ගම්මානයේ පිහිටි සුසාන භූමියේ භූමදානය කරන ලද මුස්ලිම් ජාතිකයන්ගේ මළ සිරුරු, සංවිධානාත්මක කල්ලියක් විසින් ඉවත් කර ගෙන යාම සම්බන්ධයෙන් මාලිම්බඩ පොලිස් ස්ථානය දැනුම්වත් වී තිබේද;

(ii) මේ සම්බන්ධයෙන් 2020.06.16 දින අංක C.I.B. (2) 332/125 යටතේ මාලිම්බඩ පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එම පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iv) එම සුසාන භූමියේ භූමදානය කර ඇති මුස්ලිම් ජාතිකයන්ගේ මළ සිරුරු අතුරුදහන්වීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3276/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා මේ වනවිට සියලු ඉඩම් අත්පත් කර ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම් හිමියන්ට වන්දි මුදල් ගෙවා අවසන් කර තිබේද;

(iii) ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මේ දක්වා වන්දි මුදල් ගෙවා නොමැති නම්, වන්දි මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

(v) අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගණනය කිරීමේදී, රජයේ තක්සේරු වටිනාකම, එම ඉඩම්වල වර්තමාන වෙළඳපොළ වටිනාකමට වඩා විශාල ලෙස අඩු වීමෙන් ඉඩම් හිමියන් දැඩි අසාධාරණයකට ලක් වන බැවින්, එම ඉඩම් වර්තමාන වෙළඳපොළ වටිනාකම අනුව නැවත තක්සේරු කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ ඉඩමෙන් කොටසක් පමණක් පවරා ගන්නා ලද අවස්ථාවල, ඉතිරි ඉඩම් කොටස සඳහා මායිම් සළකුණු කර ඉඩම් හිමියන්ට ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

420/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රැකියා සඳහා විදේශ ගත වූ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකිකයන්ට විදේශ රැකියා අවස්ථා ලබා දීම සඳහා එම කාලය තුළදී අලුතින් හඳුනාගන්නා ලද රටවල් කවරේද;

(iii) එම රටවල රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා විදේශ රැකියා මඟින් ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ විනිමය ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් යෝජනා කර තිබූ වසර 6කට වැඩි කාලයක් විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරන ලද දිනය කවරේද;

(iii) එම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය තුළින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

474/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කුලී රථ හා ඒ ආශ්‍රිත සේවා සපයනු ලබන විදේශීය සමාගම්වල නම් කවරේද;

(ii) 2017.01.01 සිට 2021.12.31 දක්වා එම එක් එක් සමාගම විසින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත සඳහන් කාලයේදී එම එක් එක් සමාගම විසින් ගෙවන ලද බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී රථ හා ඒ ආශ්‍රිත සේවා සැපයීම සඳහා විදේශීය සමාගම් සම්බන්ධ වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ එම සේවා සපයනු ලබන පුද්ගලයන් හා සමාගම් අසීරුතාවයට පත් වී ඇති බව පිළිගන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කුලී රථ සේවය නියාමනය කිරීමට හා සුරක්ෂිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

689/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කලවන්චිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුදාවලෙයි ප්‍රාදේශීය රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත්කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් මේ දක්වා පත් නොකිරීමට හේතු කවරේද;

(ii) එම රෝහල සඳහා ඖෂධවේදියෙකු පත් නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරම්භ කරන ලද අවස්ථාවේ සිට මේ දක්වා ඉහත රෝහලේ කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු කර නොමැති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත රෝහල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

816/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2022.05.09 වන දින ශ්‍රී ලංකාවේ පැවති කලබලකාරී අවස්ථාවේදී තම වගකීම පැහැර හරින ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉහත දින හා ඊට ආසන්න මාස කිහිපය තුළ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ඇතුළු පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකුට ප්‍රසිද්ධියේ හිරිහැර කරමින් හා රාජකාරියට බාධා කරමින් ප්‍රකෝපකාරී ලෙස හැසිරුණු පුද්ගලයන් සිටින බව පිළිගන්නේද;

(iv) මේ වනවිට එම පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022.05.09 දින ඇති වූ කලබලකාරී තත්ත්වය මධ්‍යයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඝාතනයට ලක් වූ බව දන්නේද;

(ii) එම ඝාතනයට සම්බන්ධ වූ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

834/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත අමාත්‍යාංශ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල සිය අමාත්‍යාංශ කාර්යාල පවත්වා ගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) එම එක් එක් කාර්යාලය සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කාර්යාල රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

850/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවට ලැබිය යුතු විදේශ විනිමයෙන් සැළකිය යුතු කොටසක් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය නොකර විදේශයන්හි රඳවා තබා ගනු ලබන බව දන්නේද;

(ii) එසේ රඳවා තබා ගනු ලබන විදේශ විනිමය ප්‍රමාණය හඳුනාගැනීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අභ්‍යන්තර විදේශ විනිමය වංචා වැළැක්වීම, ඒවා අනාවරණය කර ගැනීම සහ ඊට අදාළ වැරදිකරුවන්ට එරෙහිව පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින නීති කවරේද;

(ii) ඉහත සඳහන් ආකාරයේ විනිමය වංචා වැළැක්වීම සඳහා විදේශ විනිමය පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොවිඩ්-19 හේතුවෙන් මිය ගිය පුද්ගලයන්ගේ මරණ ආදාහනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය තීරණය ගැනීමේදී "ප්‍රවීණයින්ගේ කමිටුවක්" විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය නොමඟ යැවීමකට ලක්කර ඇති බවට 2022/11/29 දින දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශය සමඟ එතුමා එකඟ වන්නේද;

(ii) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය මඟින් පත්කරන ලද කමිටුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කමිටුව රජය මඟින් පත් කරන ලද කමිටුවක් නම් —

(i) එමඟින් කොවිඩ්-19 මරණවල අවසන් කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව විශේෂයෙන් සිදුකරන ලද නිර්දේශ;

(ii) පත්කිරීම් බලධාරියා;

(iii) යොමු කිරීමේ අනුදේශ සහ/හෝ අධිකාරී බලය;

(iv) සාමාජිකයන්ගේ නම් සහ තනතුරු;

(v) සභාපතිවරයාගේ නම;

(vi) එය අඛණ්ඩව රැස් වන්නේද;

(vii) නොඑසේ නම්, එය අවසන් වරට රැස්වූ දිනය;

(viii) මේ දක්වා පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව;

(ix) රැස්වීම් පවත්වනු ලබන ස්ථානය;

(x) එකී එක් එක් රැස්වීමේ මූලාසනය දරන ලද තැනැත්තන්ගේ නම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

867/2023

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, වන්නි පලුගොල්ලෑව ග්‍රාමයේ බඩඉරිඟු වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(ii) නව වෛරසයක් හේතුවෙන් එම බඩඉරිඟු වගාව විනාශ වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ග්‍රාමයේ බඩඉරිඟු ගොවීන්ට සහනයක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1305/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සිසු සැරිය" වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වනවිට ධාවනය වන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බස්රථය ධාවනය වන ගමන් මාර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) "සිසු සැරිය" වැඩසටහන තවදුරටත් පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1713/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විභාග කරනු ලබන මත්කුඩු සම්බන්ධ නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මත්කුඩු සම්බන්ධ නඩුවල සාක්ෂිකරුවන්ව සිට 2020.01.01 දින සිට මේ දක්වා කාලය තුළදී මහමගදි ඝාතනයට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත ඝාතන හේතුවෙන් නිරායුධ සාමකාමී ජනතාව භීතියට පත්වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම ඝාතන පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2023

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා,— වගා හානි සිදු කරන රිලවුන් ගහනය පාලනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික බෝගවලට වන සතුන්ගෙන් විශාල හානි සිදුවන හෙයින් ද, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්තා අනුව වන සතුන් හේතුවෙන් සිදුවන වගා හානිය වාර්ෂිකව 40% ක් පමණ එනම්, රුපියල් කෝටි 1800 ඉක්මවන හෙයින් ද, මේ අතරින් රිලවුන්ගෙන් කෘෂි වගාවන්ට සිදුවන හානි ක්‍රමයෙන් වර්ධනය වීම හේතුවෙන් මෙරට ගොවි ජනතාවට මෙන්ම රටේ ජාතික ආර්ථිකයට සෘජුවම බලපෑම් සිදුවන හෙයින් ද, ශ්‍රී ලංකාව බෞද්ධ මෙන්ම අවිහිංසාවාදී සංස්කෘතියකින් හෙබි රටක් වශයෙන් රිලවුන් විනාශ කිරීම මගින් මෙම ගැටලුව විසඳීම අනුමත කළ නොහැකි හෙයින් ද, විද්‍යාත්මක ක්‍රමවේදයක් මගින් රිලවුන් ගහනය පාලනය කිරීම සඳහා යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— දරුවන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධ වැඩසටහනක් පාසල් මට්ටමින් ප්‍රචලිත කිරීම,— විෂ සහිත ආහාර පරිභෝජනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ආයුකාලය කෙටි වීම මෙන්ම දරුණු රෝගාබාධවලට ලක්වීම ද සිදුවන බව විවිධ ආයතන විසින් පෙන්වා දී ඇති හෙයින් පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීම තුළින් ශාරීරික සෞඛ්‍ය හා නීරෝගීබව වර්ධනය කර ගත හැකි බව අවබෝධ කරවිය හැකි පරිදි ළමුන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධ වැඩසටහනක් සෞඛ්‍ය අංශ සමඟ ඒකාබද්ධව රජය විසින් සකස් කොට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් ආයතන දැඩි නියාමනයකට ලක්කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ක්‍රියාකාරකම් හේතුවෙන් නාගරික හා ග්‍රාමීය සමාජය විශාල දෙදරායාමකට ලක් වී ඇති හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය හා කල්බදු ණය පහසුකම් සම්බන්ධයෙන් එකී ආයතනවල පෙළඹවීම මත ණය ලබාගත් විශාල පවුල් සංඛ්‍යාවක් මේ වනවිට දැඩි කම්පනයකට පත් වී ඇති හෙයින් ද, එම ආයතනවල පොලී අනුපාත විවිධ මට්ටම්වල පවතින හෙයින් ද, කල්බදු ණය පහසුකම් වාරික ගෙවීමට අපොහොසත්වන පුද්ගලයන් එම ආයතනවල විවිධ බලපෑම් හා ප්‍රචණ්ඩත්වයට ලක්වන හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් සපයන ආයතන දැඩි නියාමනයකට ලක් කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීම,— පාසල් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන වාර්ෂිකව දෙමව්පියන්ගෙන් අයකර ගැනීම අඛණ්ඩව සිදුවන හෙයින් ද, වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතැම් දෙමව්පියන් හට එම මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට අපහසු වීම හේතුවෙන් එකී දෙමව්පියන්ගේ දරුවන් පන්ති කාමර තුළ දී අපහසුතාවයන්ට ලක්වීමට ඉඩ ඇති

හෙයින් ද, පාසල් සංවර්ධන කටයුතුවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගත යුතු ආකාරයත්, එම මූල්‍ය අයවැය වාර්තා ප්‍රදර්ශනය කළ යුතු ආකාරයත්, එකී සංවර්ධන කටයුතු සඳහා පසු විපරම් කටයුතු කළ යුතු ආකාරයත් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2023

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා,— ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— වසර ගණනාවක් එකම පාසලක් තුළ සේවය කිරීම හේතුවෙන් ගොඩනැගෙන පෞද්ගලික සබඳතා හේතුවෙන් ඇතැම් ළමුන් හට යම් යම් අවස්ථාවල දී අසාධාරණකම් ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ ස්ථරවල ළමයින් සමඟ සේවය කිරීම මඟින් ළමා මනස අවබෝධ කරගැනීමේ හැකියාව හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවන හෙයින් ද, දේශපාලන, සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ උප සංස්කෘතීන් අවබෝධ කර ගැනීමට ඇති අවස්ථා ගිලිහී යන හෙයින් ද, විවිධ ප්‍රාදේශීය භාෂාවන් සහ ප්‍රාදේශීය සංස්කෘතීන්ගෙන් අත්දැකීම් ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වන හෙයින් ද, අධ්‍යාපනය ලබාදීම සහ යහපත් සමාජ පුරවැසියකු බිහි කිරීම යන ඒකායන අරමුණ ඉටුවන අධ්‍යාපන ක්‍රමවේදයක් ඇති කිරීම උදෙසා සියලුම ගුරුවරුන් හට වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකීමක් සහිත වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම,— අතීතයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යාල උපකරණ සඳහා යොදා ගනු ලැබූ දැව භාණ්ඩ දීර්ඝ කාලයක් භාවිත කළ ද වර්තමානයේ දී එම ආයතන භාවිත කරන කාර්යාල උපකරණ ප්ලයිවුඩ් ෂීට් හා අනෙකුත් කෘත්‍රිම ෂීට් වර්ග යොදා සකස් කරන හෙයින් ඉතා කෙටි කාලයකින් ඒවා විනාශ වන හෙයින් ද, මෙම වත්මන් කාර්යාල උපකරණ සකස් කිරීම සඳහා විදේශ රටවලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීම හේතුවෙන් විශාල වශයෙන් විදේශ රටවලට මුදල් ගලායාම සිදුවන හෙයින් ද, අපගේ පරිසර පද්ධතියට ඉවතලන මෙම ද්‍රව්‍යවලින් දැඩි බලපෑමක් එල්ලවන හෙයින් ද, රජයේ ආයතන සඳහා  රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකිවයුතු වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.